ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2371/50 - 2024 පෙබරවාරි මස 16 වැනි සිකුරාදා - 2024.02.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 ජූනි මස 30 දිනැති අංක 2234/20 දරන රජයේ *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි පළ කරන ලද 2021 අංක 6 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය) නියෝග, ඒ යටතේ සිදුකරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි, මෙමගින් අවලංගු කර පහත අයිතමය ඒ සඳහා ආදේශ කරනු ලැබේ.

"2021 අංක 6 දරන නියෝග යටතේ යම් ණයගැනුම්කරුවෙකුට, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීමේ කාර්යය සඳහා විදේශයන්ගෙන් ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂයන්/ මුදල් ප්‍රවාහයන් නොමැති අවස්ථාවකදී, ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් එම ණය මුදල් ආපසු ගෙවීම සඳහා අවසර ලබාදෙනු ලැබේ".

EOG 02 - 0134

1A - PG 6650 — 404 (2024/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*